# Combined Maths
## 2021-THEORY
## ප්‍රවේග කාල ප්‍රස්ථාර - පසුගිය විභාග ගැටළු

### 2000

01. දිග 100 m වූ දුම්රියක් A නැවතුම් පොළකින් නිශ්චලතාවයේ සිට ගමන් අරඹා නියත ත්වරණයකින් චලනය වෙයි. පසුව දුම්රිය B සංඥා කණුවක් පසු කිරීමට තත්පර 10 ක් යයි. දුම්රියේ පිටුපස B පසුකරන විට දුම්රිය චලනය වන්නේ $11\ ms^{-1}$ ප්‍රවේගයෙනි. දුම්රියේ චලිතය සඳහා ප්‍රවේග කාල වක්‍රයක් අඳින්න.
   (i) දුම්රියේ ඉදිරිපස B සංඥා කණුව පසුකර ගියේ කුමන ප්‍රවේගයකින් කුමන කාලයේදී දැයි සොයන්න.
   (ii) දුම්රියේ ත්වරණය සොයා එහි පිටුපස B හි ඇතිවිට දුම්රිය ගමන් කළ මුළු දුර 302.5 m බව පෙන්වන්න.

### 2001

02. නවතා ඇති පොලිස් කාරයක් එය පසුකර යන $72\ km\ h^{-1}$ නියත ප්‍රවේගයකින් ගමන් කරන වෑන් රියක් නිරීක්ෂණය කරයි. ඉන් තත්පර 10 කට පසුව වෑන් රිය පසුපස හඹා යෑම සඳහා ගමන් අරඹන පොලිස් කාරයා $f\ ms^{-2}$ නියත ත්වරණයකින් 200 m දුර ගොස් $90\ km\ h^{-1}$ ප්‍රවේගයක් ලබාගනී. අනතුරුව වෑන් රිය පසු කරන තෙක්ම එය ප්‍රවේගය පවත්වාගෙන යයි. වාහන දෙකම සඳහා ප්‍රවේග - කාල ප්‍රස්තාර එකම සටහනක ඇඳ පොලිස් කාරයෙහි පළමු 200 m ගමනේ දී f ත්වරණයත් එයට වෑන් රිය පසු කිරීමට ඒවායේ ප්‍රථම හමුවීමේ සිට ගතවූ මුළු කාලයත් සොයන්න.

### 2002

03. චලනය වන දුම්රියකට කාලය $t = 0$ දී රෝධක යොදන ලදුව දුම්රියට ඒකාකාර මන්දනයක් ලැබෙයි. $t = 20\ S$ හා $t = 50\ S$ හිදී රෝධක යෙදූ පිහිටීමේ සිට එහි විස්ථාපනය පිළිවෙලින් 750 m හා 1500 m වෙයි. දුම්රිය නිශ්චලතාවයට පැමිණීම දක්වා එහි චලිතය සඳහා ප්‍රවේග කාල වක්‍රයක් අඳින්න.
   (i) දුම්රියේ මන්දනයත්
   (ii) $t = 50$ දී දුම්රියේ ප්‍රවේගයත්
   (iii) දුම්රිය නිශ්චලතාවට පැමිණෙන විට t හි අගයත් සොයන්න.

### 2003

04. බිම මත පිහිටි O ලක්ෂ්‍යයක සිට U වේගයෙන් සිරස් ව උඩු අතර ප්‍රක්ෂේපණය කරනු ලැබූ අංශුවක්, ගුරුත්ව බලයට පමණක් භාජනය වී චලනය වෙමින් T කාලයකට පසු නැවත O ට වැටෙයි. අංශුවේ චලිතය සඳහා ප්‍රවේග - කාල ප්‍රස්තාරයේ දළ සටහනක් අඳින්න.
   ප්‍රවේග - කාල ප්‍රස්තාරය පමණක් උපයෝගී කර ගනිමින්,
   (i) අංශුවේ උඩු අතට චලිතය සඳහා ගත වූ කාලයත් යටියත් චලිතය සඳහා ගත වූ කාලයත් එකම බවද $U/g$ ට සමාන බවද,
   (ii) අංශුව නැගි වැඩිතම උස $1/2\ \frac{U^2}{g}$ බවද
   (iii) $t_1$ සහ $t_2$ කාලවල දී අංශුව එකම උසකින් පිහිටියේ නම් $t_1 + t_2 = T$ බවද පෙන්වන්න.

### 2004

05. බිම සිට h උසකින් $\sqrt{2}\ gT$ වේගයෙන් සිරස්ව ප්‍රක්ෂේපණය කෙරෙන අංශුවක් ගුරුත්වය යටතේ චලනය වෙයි. මෙහි T යනු නියතයකි. අංශුවේ ප්‍රවේගයේ සිරස් හා සිරස් සංරචක සඳහා වෙන වෙනම වේග - කාල ප්‍රස්තාර අඳින්න. අංශුව බිම පතිත වන විට එය ප්‍රක්ෂේපණ ලක්ෂ්‍යයේ සිට $3/2\ gT^2$ දුරකින් වෙයිනම්, වේග - කාල ප්‍රස්තාර යොදා ගනිමින්, අංශුව බිමට ළඟා වීමට ගන්නා කාලය T බව හා $h = {}^1/_2\ gT^2$ බව පෙන්වන්න.

### 2005

06. පොළොවේ සිට h උසකින්, $t = 0$ කාලයේ දී, නිශ්චලතාවයෙන් අතහරිනු ලබන A නම් අංශුවක් ගුරුත්වය යටතේ සිරස්ව වැටෙයි. ඒ මොහොතේම B නම් වෙනත් අංශුවක් පොළොවේ ලක්ෂ්‍යයක සිට U ප්‍රවේගයෙන් සිරස්ව උඩු අතට ප්‍රක්ෂේප කෙරෙයි. එක් එක් අංශුවෙහි චලිතය සඳහා ප්‍රවේග - කාල ප්‍රස්තාරය එකම රූප සටහනෙහි අඳින්න. ප්‍රවේග - කාල ප්‍රස්තාර භාවිතයෙන් ${}^h/_U$ කාලයේ දී අංශු දෙකම පොළොවෙහි සිට එකම උසකින් ඇති බව පෙන්වන්න.

## 2006

07. සෘජු පාරක සිටින මිනිසෙක්, තමාගෙන් යම් දුරක් ඉදිරියේ වූ බස් නැවතුමක නිශ්චලතාවයේ සිට නියත ත්වරණයකින් ගමන් අරඹන බස් රථයක් දකියි. ක්ෂණිකව ඔහු බස් රථය පසුපස ඒකාකාර U $ms^{-1}$ ප්‍රවේගයකින් දුවගොස් තත්පර T කාලයක දී එයට යන්තමින් ගොඩවීමට සමත් වෙයි. මිනිසා සහ බස් රථය සඳහා ප්‍රවේග කාල ප්‍රස්තාර එකම රූපයක අඳින්න. U හා T ඇසුරින් බස් රථයේ ත්වරණයත්, බස් නැවතුමේ සිට මිනිසාගේ ආරම්භක දුරත් සොයන්න.

## 2007

08. නිශ්චලතාවයේ සිට ගමන් අරඹන දුම්රියක් $\frac{1}{3}$ $ms^{-2}$ ඒකාකාර ත්වරණයකින් සෘජු මාර්ගයක චලනය වී V $ms^{-1}$ ක ප්‍රවේගයක් ලබා ගනියි. ඊළඟට එය V ඒකාකාර ප්‍රවේගයෙන් යම් කාල ප්‍රාන්තරයක් තුළ චලනය වෙයි. අවසානයේ දී දුම්රිය 1 $ms^{-2}$ ඒකාකාර මන්දනයකින් චලනය වී නිශ්චලතාවයට පැමිණෙයි. ගත වූ මුළු කාලය මිනිත්තුවක් වන අතර ගමන් කළ මුළු දුර මීටර 432 ක් වෙයි. දුම්රියේ චලිතය සඳහා ප්‍රවේග කාල ප්‍රස්තාරය ඇඳ V හි අගය සොයන්න. එනයින් චලිතයේ අවස්ථා තුනේදී ගමන් කළ දුරවල් 3 : 2 : 1 අනුපාතයට වන බව පෙන්වන්න.

## 2008

09. දුම්රියක් සෘජු මාර්ගයක ඒකාකාර V $km\,h^{-1}$ ප්‍රවේගයෙන් සාමාන්‍යයෙන් ගමන් කරයි. මාර්ගයේ ඉදිරි අලුත්වැඩියාවක් නිසා දුම්රිය d km දුරක් ඒකාකාර මන්දනයකින් ගොස් U $km\,h^{-1}$ දක්වා ප්‍රවේගය අඩුකර ගනියි. ඊළඟට දුම්රිය ඒකාකාර U ප්‍රවේගයෙන් මාර්ගය අලුත්වැඩියා කෙරෙන 2d km දුර චලනය වෙයි. අනතුරුව 3d km දුරක් ඒකාකාර ත්වරණයෙන් චලනය වී එය V ප්‍රවේගය නැවත ලබා ගනියි. දුම්රියේ චලනය සඳහා ප්‍රවේග කාල ප්‍රස්තාරය අඳින්න. මාර්ගය අලුත්වැඩියාව නිසා අපතේ යන කාලය දුම්රියේ සාමාන්‍ය චලිතය සමග සැසඳීමේදී පැය $\frac{2d(V-U)(V+3U)}{UV\&U+V)}$ බව පෙන්වන්න.

## 2009

10. බැලූනයක්, පොළවට සාපේක්ෂව නියත U ප්‍රවේගයෙන් ඉහළ නගියි. කාලය $t = 0$ හි දී අංශුවක්, බැලූනයට සාපේක්ෂව V ප්‍රවේගයෙන් බැලූනයේ සිට සිරස්ව ඉහළට ප්‍රක්ෂේප කරනු ලැබේ. කාලය $t = t_1$ හි දී තවත් Q අංශුවක්, බැලූනයට සාපේක්ෂව V ප්‍රවේගයෙන්ම බැලූනයේ සිට සිරස්ව ඉහළට ප්‍රක්ෂේප කරනු ලැබේ. කාලය $t = t_2$ හි දී P සහ Q අංශු දෙක එකිනෙකට හමුවෙයි.

(i) $0 \leq t \leq t_1$ ප්‍රාන්තරයේ දී බැලූනයට සාපේක්ෂව P හි චලිතය සහ

(ii) $t_1 \leq t \leq t_1$ ප්‍රාන්තරයේ දී P ට සාපේක්ෂව Q චලිතය සඳහා ප්‍රවේග - කාල ප්‍රස්තාරවල දළ සටහන්, වෙන වෙනම අඳින්න. ඒ නයින් හෝ අන් ක්‍රමයකින් හෝ $t_2 = \frac{v}{g} + \frac{1}{2} t_1$ බව පෙන්වන්න. අංශු දෙක හමුවන විට Q සහ P හි ප්‍රවේග පිළිවෙලින් $U \pm \frac{1}{2} gt_1$ බව තවදුරටත් පෙන්වන්න.

## 2010

11. ස්කන්ධය M වූ P නම් අංශුවක්, පොළොව මත පිහිටි ලක්ෂ්‍යයක සිට $t = 0$ කාලයේදී u ප්‍රවේගයෙන් සිරස්ව ඉහළට ගුරුත්වය යටතේ ප්‍රක්ෂේප කෙරෙයි. එක එකක ස්කන්ධය ඉතා කුඩා $m(<<M)$ වූ $P_1$, $P_2$ හා $P_3$ නම් අංශු තුනක් පිළිවෙලින් $t = \frac{u}{2g}$ , $t = \frac{u}{g}$ හා $t = \frac{3u}{2g}$ කාලවලදී P අංශුවට සාපේක්ෂව තිරස් ලෙස එකම අභි දිශාවට 2v, 3v හා 6v ප්‍රවේගවලින් P අංශුවේ සිට ප්‍රක්ෂේප කෙරෙයි.
P අංශුවේ ප්‍රවේගය සඳහා ප්‍රවේග - කාල ප්‍රස්තාරය අඳින්න. $P_1$ , $P_2$ හා $P_3$ අංශුවල ප්‍රවේගයන්ගේ සිරස් සංරචක එක එකක් සඳහා ප්‍රවේග - කාල ප්‍රස්තාර, P අංශුවේ ප්‍රවේග - කාල ප්‍රස්තාරයේ කොටස් සමග සම්පාත වන බව පෙන්වා, එම කොටස් හඳුනා දෙන්න. $P_1$, $P_2$ හා $P_3$ අංශුවල ප්‍රවේගයන්ගේ තිරස් සංරචක එක එකක් සඳහා ප්‍රවේග - කාල ප්‍රස්තාර, වෙනම රූප සටහනක අඳින්න. ප්‍රවේග - කාල ප්‍රස්තාර යොදා ගනිමින්,

(i) අංශු හතර $t = \frac{2u}{g}$ එකම කාලයේදී පොළොවට ළඟාවන බව,

(ii) $P_1$, $P_2$ හා $P_3$ අංශු තුන එකම ස්ථානයකදී පොළොවට වැටෙන බව පෙන්වන්න.

## 2012

12. P නම් අංශුවක් O ලක්ෂ්‍යයේදී ගුරුත්වය යටතේ u ප්‍රවේගයෙන් සිරස් ලෙස ඉහළට ප්‍රක්ෂේප කෙරේ. $\frac{u}{2g}$ කාලයකට පසු, Q නම් තවත් අංශුවක් O ලක්ෂ්‍යයේදී ගුරුත්වය යටතේ $v(> u)$ ප්‍රවේගයෙන් සිරස් ලෙස ඉහළට ප්‍රක්ෂේප කෙරේ. A යනු P අංශුව ළඟා වන ඉහළම ලක්ෂ්‍යය යැයි ගනිමු. P හා Q අංශු A ලක්ෂ්‍යයේ දී හමුවෙයි. P හා Q අංශුවල සම්පූර්ණ චලිත සඳහා ප්‍රවේග - කාල ප්‍රස්තාර එකම රූප සටහනක අඳින්න. මෙම ප්‍රවේග - කාල ප්‍රස්තාර යොදාගෙන

(i) $OA = \frac{u^2}{2g}$ බව (ii) $v = \frac{5u}{4}$ හා A ලක්ෂ්‍යයේ දී Q අංශුවේ ප්‍රවේගය $\frac{3u}{4}$ බව,

(iii) Q අංශුව ඉහළතම ලක්ෂ්‍යයට ළඟාවන විට P අංශුව, O ලක්ෂ්‍යයේ සිට පිහිටන උස $\frac{7u^2}{32g}$ බව පෙන්වන්න.

## 2013

13. අංශුවක්, අචල දෘඪ තිරස් ගෙබිමක වූ ලක්ෂ්‍යයකින් සිරස්ව උඩු අතට u ප්‍රවේගයකින් ප්‍රක්ෂේප කරනු ලැබේ. ගුරුත්වය යටතේ චලනය වීමෙන් පසු එය ගෙබිම හා ගැටෙයි. අංශුව හා ගෙබිම අතර ප්‍රත්‍යාගති සංගුණකය $e(0 < e < 1)$ වේ.

(i) තුන්වෙනි ගැටුම දක්වා අංශුවේ චලිතය සඳහා ප්‍රවේග - කාල ප්‍රස්තාරයෙහි දළ සටහනක් අඳින්න.

(ii) තුන්වෙනි ගැටුම දක්වා අංශුව ගන්නා කාලය $\frac{2u}{g}(1 + e + e^2)$ බව පෙන්වන්න.

(iii) නිශ්චලතාවයට පැමිණීමට අංශුව ගන්නා මුළු කාලය $\frac{2u}{g(1 - e)}$ බව තවදුරටත් පෙන්වන්න.

## 2014

14. තිරසට $\alpha\ (0 < \alpha < \pi/2)$ කෝණයකින් ආනත අචල සුමට තලයක් වූ O ලක්ෂ්‍යයක P හා Q අංශු දෙකක් තබා ඇත. O හරහා වූ උපරිම බෑවුම් රේඛාව දිගේ උඩු අතට P අංශුවට u ප්‍රවේගයක් දෙනු ලබන අතර, එම මොහොතේ ම, Q අංශුව නිශ්චලතාවයේ සිට මුදා හරිනු ලැබේ. අංශු දෙක ආනත තලය හැර නොයන බව උපකල්පනය කරමින්, P හා Q හි චලිත සඳහා ප්‍රවේග - කාල ප්‍රස්තාරවල දළ සටහන් එක ම රූපයක අඳින්න.
මෙම ප්‍රස්තාර භාවිතයෙන්, P අංශුව O ලක්ෂ්‍යයට නැවත පැමිණෙන මොහොතේ දී Q අංශුව O සිට $\frac{2u^2}{g \sin \alpha}$ දුරකින් පිහිටන බව පෙන්වන්න.

## 2015

15. P හා Q අංශු දෙකක් අචල තිරස් ගෙබිමක් මත ලක්ෂ්‍ය දෙකක සිට පිළිවෙළින් u හා $\frac{u}{\sqrt{2}}$ වේගවලින් සිරස් ව ඉහළට, එක විට ප්‍රක්ෂේප කරනු ලැබේ. ගෙබිම සිට $\frac{u^2}{4g}$ උසකින් අචල සුමට තිරස් සිවිලිමක් ඇත. සිවිලිමත් එය සමඟ ගැටෙන P අංශුවත් අතර ප්‍රත්‍යාගති සංගුණකය $\frac{1}{\sqrt{2}}$ වන අතර, අංශු දෙක ගුරුත්වය යටතේ පමණක් ඉහළට හා පහළට චලනය වේ.

(i) P අංශුව සිවිලිම සමඟ ගැටීමට මොහොතකට පෙර එහි වේගයත්, ගැටීම සිදුවන මොහොත දක්වා ගත වූ $T_1$ කාලයත් සොයන්න.

P අංශුව එහි ප්‍රක්ෂේප ලක්ෂ්‍යය කරා $\frac{u\sqrt{3}}{2}$ වේගයෙන් ආපසු පැමිණෙන බව පෙන්වන්න.

(ii) Q අංශුව, සිවිලිමට යන්තමින් ළඟා වන බව පෙන්වා, එම මොහොත දක්වා ගත වූ $T_2$ කාලය සොයන්න.

(iii) P හා Q අංශු දෙකෙහි ප්‍රක්ෂේප මොහොතේ සිට ආපසු අදාළ ප්‍රක්ෂේප ලක්ෂ්‍ය වෙතට පැමිණීම දක්වා, ඒවායේ චලිත සඳහා ප්‍රවේග - කාල ප්‍රස්තාරවල දළ සටහන්, එකම රූපයක අඳින්න.

(iv) ප්‍රවේග - කාල ප්‍රස්තාර භාවිතයෙන්, P අංශුව සිවිලිම සමඟ ගැටෙන මොහොතේ දී Q අංශුව, සිවිලිමට $\frac{u^2}{2g}(\sqrt{2} - 1)^2$ සිරස් දුරක් පහළින් තිබෙන බව පෙන්වන්න.

## 2016

16. අප්‍රත්‍යාස්ථ තිරස් ගෙබිමකට 3h උසක් ඉහළින් සවිකර ඇති කුඩා සුමට කප්පියක් මතින් යන සැහැල්ලු අවිතන්‍ය තන්තුවක් මගින්, ස්කන්ධය m වූ P අංශුවක් ස්කන්ධය 3m වූ Q අංශුවකට සම්බන්ධ කර ඇත. ආරම්භයේ දී අංශු දෙක ගෙබිමට h උසකින් තන්තුව තදව ඇතිව අල්වා තබා නිශ්චලතාවයේ සිට මුදා හරිනු ලැබේ. P හා Q හි චලිතයන්ට වෙන වෙන ම නිව්ටන් දෙවැනි නියමය යෙදීමෙන්, එක් එක් අංශුවේ ත්වරණයෙහි විශාලත්වය $\frac{g}{2}$ බව පෙන්වන්න.




$t_0$ කාලයකට පසුව Q අංශුව ගෙබිම සමග ගැටී ක්ෂණිකව නිශ්චලතාවයට පැමිණේ, තවත් $t_1$ කාලයක් නිශ්චලතාවයේ තිබී උඩු අතට චලිතය ආරම්භ කරයි. Q අංශුව උඩු අතට චලිත ආරම්භ කරන තෙක් P හා Q අංශු දෙකෙහි චලිත සඳහා ප්‍රවේග - කාල ප්‍රස්තාරවල දළ සටහන් වෙන වෙන ම අඳින්න.

මෙම ප්‍රස්තාර භාවිතයෙන්, $t_0 = 2\sqrt{\frac{h}{g}}$ බව පෙන්වා, g හා h ඇසුරෙන් $t_1$ සොයන්න. OP අංශුව ගෙබිමේ සිට $\frac{5h}{2}$ උපරිම උසකට ළඟා වන බව තවදුරටත් පෙන්වන්න.

## 2017

17. කුඩා ඒකාකාර බෝලයක් රැගත් බැලූනයක් කාලය $t = 0$ දී පොළොව මත ලක්ෂ්‍යයකින් නිශ්චලතාවයෙන් ආරම්භ කර ඒකාකාර f ත්වරණයකින් සිරස් ව ඉහළට චලනය වේ. මෙහි $f < g$ වේ. කාලය $t = T$ හි දී බෝලය, බැලූනයෙන් සීරුවෙන් ඉවත් වී ගුරුත්වය යටතේ චලනය වේ. $t = 0$ සිට බෝලය එහි උපරිම උස කරා ළඟා වන තෙක් බෝලයේ උඩු අත් චලිතය සඳහා ප්‍රවේග - කාල ප්‍රස්තාරයේ දළ සටහනක් අඳින්න. T, f හා g ඇසුරෙන්, බෝලය ළඟා වූ උපරිම උස සොයන්න.

## 2018

18. මීටර 4d ගැඹුරු පතලක චලනය වන සෝපානයක් $t = 0$ කාලයේ දී A ලක්ෂ්‍යයකින් නිශ්චලතාවේ සිට සිරස්ව පහළට චලනය වීමට පටන් ගනී. එය, පළමුව $g/2\ ms^{-2}$ නියත ත්වරණයෙන් මීටර d දුරක් චලනය වී ඊළඟට එම චලිතය අවසානයේ ලබාගත් ප්‍රවේගයෙන් තව මීටර d දුරක් චලනය වේ. සෝපානය ඉන්පසු A සිට මීටර 4d දුරක් පහළින් පිහිටි B ලක්ෂ්‍යයේ දී නිශ්චලතාවට පැමිණෙන පරිදි නියත මන්දනයකින් ඉතිරි දුර ද චලනය වේ. සෝපානයෙහි චලිතය සඳහා ප්‍රවේග - කාල වක්‍රයේ දළ සටහනක් අඳින්න.
ඒ නයින් A හා B දක්වා පහළට චලිතය සඳහා සෝපානය ගනු ලබන මුළු කාලය සොයන්න.